## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය
## අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධිත උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ තහවුරු කරන ලද ස්ථිර සේවක භවතුන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

සෑම අයදුම්පතක්ම මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කොට තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/මණ්ඩපාධිපති මෙම ආයතනයේ නම් අදාළ අංශ ප්‍රධාන මඟින් 2020.12.24 වන දිනට හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් සහකාර ලේඛකාධිකාරී, ආයතන අංශය, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, රාජගිරිය යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **ඉල්ලුම් කරනු ලබන තනතුර** සඳහන් කළයුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

---

### 01. පුස්තකාල තොරතුරු සහකාර III ශ්‍රේණිය (Library Information Assistant Grade III)

**සුදුසුකම්:**

1. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය
   i. සිංහල/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී සමත්ව තිබිය යුතුය.

සහ

2. උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයේ ප්‍රාථමික මට්ටමේ (UPL වැටුප් කාණ්ඩයට අයත් ) දැනට දරණ තනතුරෙහි තහවරු කරන ලද අවම වශයෙන් වසර 5ක අඛණ්ඩ සතුටුදායක සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

❖ පහත සුදුසුකම සපුරා ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවය දෙනු ලැබේ.
මාස හයකට නොඅඩු කාලයක් පිළිගත් හැකි ආයතනයක පරිගණක භාවිතය පිළිබඳ සුදුසුකමක් ලබා තිබීම.

**තෝරා ගැනීම :**
ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**වැටුප් ක්‍රමය:** රු. 30,725.00-17X300-35,825.00 [UMN1(IIIA)] (මාසික) වැටුප් පරිමාණය හිමි වේ.
මෙම වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (V) අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

---

### 02. පුහුණුවන කාර්මික නිලධාරී (II ශ්‍රේණිය, ‘ ආ’ ඛණ්ඩය) (Trainee Technical Officer Seg.B)

**සුදුසුකම්:**

1. (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයට දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් පහකට (05) කට සම්මාන සමාර්ථ සහිතව විෂයන් හයකින් (06) කින් සමත් වීම. සම්මාන සමාර්ථය ලත් විෂයන් අතරට විද්‍යාව සහ ගණිතය ඇතුළත් විය යුතුය.

හෝ

(ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිතය යන විෂයයන් ඇතුව විෂයන් හයකින් (06) කින් සමත්ව තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන